**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය**

# විශ්වවිද්‍යාල ප්‍රවේශය

## 2023/2024 අධ්‍යයන වර්ෂය

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, බුදුන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුකූලව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම, භික්ෂූන් වහන්සේලා අතර බෞද්ධ භාවනාව ප්‍රචලිත කිරීම හා ඒ පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, ථෙරවාද බුද්ධ ධර්මය ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවල ප්‍රචාරය කිරීමට භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම, තුලනාත්මක සමය අධ්‍යයනය, බුද්ධ ධර්මය පිළිබඳ පර්යේෂණ කිරීමට ධෛර්යය දීම යනාදි පරමාර්ථ ඉටු කර ගැනීමේ අරමුණින් සංස්ථාපනය කරන ලද උසස් අධ්‍යාපන ආයතනයකි.

ඒ සඳහා මෙම විශ්වවිද්‍යාලය මගින් පහත සඳහන් උපාධි පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ.

1. **ශාස්ත්‍රවේදි (ගෞරව) උපාධි පාඨමාලාව (SLQF Level 6)** - වසර 04
2. **බෞද්ධ අධ්‍යයනය පිළිබඳ අධ්‍යාපනවේදි (ගෞරව) උපාධි පාඨමාලාව (SLQF 6)** - වසර 04
3. **ශාස්ත්‍රවේදි (සාමාන්‍ය) උපාධි පාඨමාලාව (SLQF 5)** - වසර 03
4. **ශාස්ත්‍රවේදි (ගෞරව) ත්‍රිපිටක අධ්‍යයන උපාධි පාඨමාලාව (SLQF Level 6)** - වසර 04

**<u>බඳවාගනු ලබන ආකාරය</u> :- (උක්ත 1,2,3 උපාධි පාඨමාලාවන්ට අදාළව)**

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා 2020, 2021, 2022 හෝ 2023 යන වර්ෂවල දී පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් සපුරා ඇති භික්ෂූන් වහන්සේලාගෙන් හා ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වනු ලබන ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් සමත් බෞද්ධ භික්ෂූන් වහන්සේලාගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ලබාගත් ඉසෙඩ් (Z-Score) ලකුණුවල ප්‍රමුඛතාව මත සම්මුඛ පරීක්ෂණයකට ලක් කර එහි දී ලබාගත් ලකුණු පදනම් කරගෙන සිසුන් බඳවා ගනු ලැබේ.
- අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත බඳවාගන්නා සිසුන් සාමාන්‍ය පොදු පරීක්ෂණයේ දී 30% හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම අනිවාර්ය වේ.
- මේ හැර ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වනු ලබන ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් සමත් භික්ෂූන් වහන්සේලා ද තෝරාගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 10%ක් වන අනුපාතයට බඳවා ගනු ලැබේ.

**<u>ප්‍රවේශ සුදුසුකම්</u>**

| | | |
|---|---|---|
| 01. | බෞද්ධ විහාර දේවාලගම් පනතේ නියමයන්ට අනුකූලව ලියාපදිංචි වූ භික්ෂූන් වහන්සේ නමක් වීම | |
| | | **හා** |
| 02. | i) | බුද්ධ ධර්මය/බෞද්ධ ශිෂ්ටාචාරය සහ පාලි/ සංස්කෘත/ වෙනත් භාෂා විෂයයක් සහිතව අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම. |
| | | **හෝ** |

| | | |
|---|---|---|
| | ii) | ප්‍රාචීන මධ්‍යම විභාගය සමත් වී තිබීම.<br><br>(විශ්වවිද්‍යාලයට තෝරා ගනු ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 10%ක් වන අනුපාතයට ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වනු ලබන ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් භාෂාත්‍රයෙන් සමත් භික්ෂූන් වහන්සේලා බඳවා ගනු ලැබේ.) |
| | | **හෝ** |
| | iii) | බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි, සංස්කෘත යන විෂයයන්ගෙන් එක් විෂයයක්වත් ඇතුළුව අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම. |
| | | **හෝ** |
| | iv) | ඕනෑම කලා විෂය ධාරාවක් යටතේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම.<br><br>බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි, සංස්කෘත යන විෂයයක් යටතේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් (වසරක හෝ ඊට වැඩි) ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම. (SLQF Level 3 / NVQ Level 5 ) |
| | | **හෝ** |
| | v) | ඕනෑම විෂය ධාරාවක් යටතේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම.<br><br>ඉහත අංක i, ii, iii හා iv යටතේ සුදුසුකම් සපුරා ඇති ස්වාමීන් වහන්සේලා ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් පමණක් අංක (v) යටතේ සුදුසුකම් ඇති ස්වාමීන් වහන්සේලා බඳවා ගැනීමට සලකා බලනු ලැබේ. |

**<u>බඳවාගනු ලබන ආකාරය</u> :- (උක්ත 4 හි සඳහන් ත්‍රිපිටක අධ්‍යයන උපාධි පාඨමාලාවට අදාළව)**

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය මගින් 2022/2023 අධ්‍යයන වර්ෂයේ සිට ත්‍රිපිටකය අධ්‍යයනය කිරීම අරමුණු කරගෙන හඳුන්වා දුන් ශාස්ත්‍රවේදී (ගෞරව) ත්‍රිපිටක අධ්‍යයන උපාධි පාඨමාලාවට 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති බෞද්ධ භික්ෂූන් වහන්සේලාගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>ප්‍රවේශ සුදුසුකම්</u>**

| | | |
|---|---|---|
| 01. | • බෞද්ධ විහාර දේවාලගම් පනතේ නියමයන්ට අනුකූලව ලියාපදිංචි වූ භික්ෂූන් වහන්සේ නමක් වීම. (විදේශීය සිසුන් සඳහා මෙය අදාළ නොවේ) | |
| | | **හා** |
| 02. | i) | ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වනු ලබන ප්‍රාචීන ප්‍රාරම්භ හෝ ඉන් ඉහළ විභාගයක් සමත් වී තිබීම |
| | | **හෝ** |
| | ii) | ඕනෑම විෂය ධාරාවක් යටතේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම හා සාමාන්‍ය පොදු පරීක්ෂණයේ දී 30 % කට නො අඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම |
| | | **හෝ** |
| | iii) | බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි, සංස්කෘත හෝ බෞද්ධ අධ්‍යයන විෂයයන් යටතේ SLQF 03 සහ 04/ NVQ 05 සහ 06 ස්තරවලට අදාළ සුදුසුකම් සපුරා තිබීම |
| | | **හෝ** |
| | iv) | ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගන්නා වෙනත් සුදුසුකමක් සපුරා තිබීම. |

- මෙම උපාධි පාඨමාලාවට ලැබෙන අයදුම්පත් ප්‍රමාණය මත සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා ප්‍රවේශ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. ප්‍රාචීන මධ්‍යම හා අවසාන විභාග සමත් සිසුන් ප්‍රවේශ පරීක්ෂණයෙන් නිදහස් වේ.

**අයදුම්පත් ලබා ගැනීම හා යොමු කිරීම.**

www.busl.ac.lk විශ්වවිද්‍යාලයීය නිල වෙබ් අඩවියෙන් බා ගත කරගනු ලැබූ අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කොට අදාළ ලේඛනවල සහතික කළ පිටපත් හා අනුරාධපුර මහජන බැංකුවේ 008-1001-5001-4462 අංක දරන ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයීය පුනරාවර්තන ගිණුමට රු.200.00 මුදලක් බැරකර ලබාගත් ලදුපත ද සමග **2024.07.26** දින හෝ එදිනට පෙර ලැබෙන සේ **සහකාර ලේඛකාධිකාරි (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා), ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුරය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"විශ්වවිද්‍යාල ප්‍රවේශය (අභ්‍යන්තර) - 2023/2024"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**සැ.යු. - ඔබ අයදුම් කරන්නේ ශාස්ත්‍රවේදි (ගෞරව) ත්‍රිපිටක අධ්‍යයන උපාධි පාඨමාලාවට නම් ඊට අදාළ අයදුම් පත භාවිත කරන්න.**

**අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**මහෝපාධ්‍යායයන් වහන්සේ,**
**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,**
**අනුරාධපුරය.**
**2024.06.19**